රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 14/94

මගේ අංකය :- 1-543ඊ/807ඩී/3/94,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994.03.30.

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

පළාත් පාලන පරිපාලන සේවය (ප.පා.ප.සේ.)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී.ලං.ප.සේ.) ට
අන්තර්ග්‍රහණය කිරීම - ජ්‍යෙෂ්ඨත්වය යථා තත්ත්වයට
පැමිණවීම - පළමුවෙනි පන්තියට පත් කිරීම - පත්කිරීම්
පෙරදතම් කිරීම.

අංක.20/92 හා 1992.05.05 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයට අවධානයට යොමු කරනු ලැබේ.

02. පහත සඳහන් පරිදි කටයුතු කිරීමට තීරණය කර ඇත.

(අ) ශ්‍රී.ලං.ප.සේ. ව්‍යවස්ථාවට අනුව වෙනත් අයුරකින් නොසුදුසු නොවෙතොත් 1979.01.01 දින හෝ ඊට පෙර ශ්‍රී.ලං.ප.සේ. II පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබුවාවූත් 1992.03.04 දින වන විට ශ්‍රී.ලං.ප.සේ. II පන්තියේ I ශ්‍රේණියේ සිටියාවූත් නිලධාරීන් ඔවුනට පුද්ගලික වන සේ අධි සේවක සංඛ්‍යා පදනම මත 1992.03.04 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී.ලං.ප.සේ. 1 පන්තියට උසස් කිරීමටත්,

(ආ) එසේ උසස් කරනු ලැබූ නිලධාරීන් 1992.03.04 දින ශ්‍රී.ලං.ප.සේ. 1 පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ පළාත් පාලන පරිපාලන සේවයේ නිලධාරීන්ට වඩා ජ්‍යෙෂ්ඨ වන ලෙස පිහිටුවීමටත්

(ඇ) ඉහත (අ) ඡේදයේ සඳහන් නිලධාරීන්ට 1992.03.04 වන දින සිට බලපැවැත්වෙන පරිදි හිඟ වැටුප් ගෙවීමටත්,

(ඈ) ශ්‍රී.ලං.ප.සේ. I වන පන්තියට මින් පසුව කරනු ලබන සියලුම උසස්වීම් වලදී ශ්‍රී.ලං.ප.සේ. ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් තරයේ පිළිපැදිමටත්,

03. ඉහත සඳහන් තීරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා මේ සමඟ ඇති ආකෘතියට අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් මගින් මා වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ශ්‍රී.ලං.ප.සේ.නිලධාරීන්ට දන්වන්න.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

ආකෘතිය.

# පළාත් පාලන පරිපාලන සේවය (ප.පා.ප.සේ.) ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී.ලං.ප.සේ.) ට අන්තර්ග්‍රහණය කිරීම - ජ්‍යෙෂ්ඨත්වය යථා තත්ත්වයට පැමිණවීම - පළමුවෙනි පන්තියට පත් කිරීම - පත් කිරීම් පෙරදාතම් කිරීම.

1 වන කොටස

01. (අ) නිලධාරියාගේ නම :-

(ආ) ශ්‍රී.ලං.ප.සේවයට පත් වූ දිනය :-

(ඇ) ශ්‍රී.ලං.ප.සේවයේ II පන්තියේ I ශ්‍රේණියට පත්වූ දිනය :-

02. (අ) වර්තමාන තනතුර හා දෙපාර්තමේන්තුව :-

(ආ) රාජකාරි ලිපිනය :-

02. ශ්‍රී.ලං.ප.සේවයට බඳවාගනු ලැබූ ක්‍රමය :-
විවෘත තරග විභාගයෙන්/සීමිත තරග විභාගයෙන්/කුසලතාවය මත
උසස් කරනු ලැබීමෙන්

03. වර්තමාන වාර්ෂික වැටුප :-

04. මා, අංක.................................... හා.................................... දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණය අනුව ශ්‍රී.ලං.ප.සේවයේ 1 වන පන්තියට පත් කරනු ලැබීමට සුදුසුකම් ලබා ඇති බව ප්‍රකාශ කරමි. මා ශ්‍රී.ලං.ප.සේ. ව්‍යවස්ථාව අනුව උසස්වීම් ලැබීමට නොසුදුසු වී නැත. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදිය.

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :-

14/94

II කොටස

## <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.</u>

මෙම ආකෘති පත්‍රයේ ............................................................................ මහතා/මහත්මිය/මෙනවිය විසින් සපයා ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු සමඟ පරීක්ෂා කර බැලූ බවත්, ඒ අනුව ඒවා නිවැරුදි බවත් සහතික කරමි. ඔහු/ඇය අංක..................................... හා ............................. දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණය අනුව ශ්‍රී.ලං.ප.සේ. 1 වන පන්තියට උසස් කරනු ලැබීමට සුදුසුකම් ලබයි.

මෙම ඉල්ලුම් පත්‍රය අමුණා ඇති ලිපියේ මවිසින් දක්වන ලද හේතු අනුව නිර්දේශ කළ නොහැක.

(නොගැලපෙන දෑ කපා හරින්න.)

අත්සන
නම හා තනතුර

දිනය:-

---

III වන කොටස

අංක ................................ හා .................................... දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණයේ දක්වෙන ආකාරයට ......................................... මහතා/මහත්මිය/මෙනවිය ශ්‍රී.ලං.ප.සේ. 1 වන පන්තියට පත්කිරීම සඳහා සුදුසුකම් ලබයි/නොලබයි.

ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරමි/නොකරමි.
(නොගැලපෙන දෑ කපා හරින්න)

අත්සන
නම
ලේකම්

දිනය: ........................................අමාත්‍යාංශය